**යක්කලමුල්ල ප්‍රාදේශීය සභාව**
**ගාල්ල දිස්ත්‍රික්කය**

**-----------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2016 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2017 ජුනි 06 දින ද, ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන 2016 අප්‍රේල් 04 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, 2016 වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2017 ඔක්තෝබර් 20 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2016 දෙසැම්බර් 31 දිනට යක්කලමුල්ල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත දැක්වෙන ගිණුම්කරණ අඩුපාඩු විගණනයේදී නිරීක්ෂණය විය.

(අ) ඉකුත් වර්ෂයේදී පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයෙන් සභාවට ලැබී තිබූ කම්පන රෝලයේ වටිනාකම තක්සේරු කර ගිණුම් ගතකර නොතිබුණි.

(ආ) 2012 වර්ෂයේ දී භාණ්ඩ සමීක්ෂණයෙන් ඉවත් කරන ලද පිරිවැය රු.153,450 ක් වූ ඡායා පිටපත් යන්ත්‍රයේ වටිනාකමට අදාළ ගැලපීම් කිරීමට සමාලෝචිත වර්ෂයේදී ද කටයුතු කර නොතිබුණි.

(ඇ) සංචාරක මණ්ඩලයේ අනුමත හෝටලයකින් අය කරගෙන තිබුණු රු.45,630 ක් වූ සියයට 1 බදු ගිණුම් ගතකර නොතිබුණි.

#### 1.3.2 නොසැසඳූ පාලන ගිණුම්

මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් එකතුව රු.14,757,267 ක් වූ ගිණුම් විෂයයන් 09 කට අදාළ ශේෂයන් සහ ඒවාට අදාළ උපයෝගී ලේඛන හා වාර්තාවල දැක්වෙන ශේෂයන් අතර එකතුව රු.1,115,729 ක් වූ වෙනස්කම් දක්නට ලැබුණි.

**1.3.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

-----------------------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂයේ අවසානයට වූ එකතුව රු.16,558,777 ක් වූ ලැබිය යුතු ගිණුම් ශේෂ 09 ක වටිනාකම අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පළාත් පාලන විශ්‍රාම වැටුප් අරමුදලට ගෙවිය යුතු රු.1,415,454 ක ශේෂය නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කළයුතු රු.322,616 ක මුද්දර ගාස්තු නිරවුල් කර නොතිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට දේශීය ණය සංවර්ධන අරමුදලට ගෙවිය යුතු රු.9,846,050 ක මුදල නිරවුල් කිරීම සඳහා විධිමත් වැඩපිළිවෙලක් සකස් කර නොතිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයේ අවසානයට රු.21,586,605 ක් වූ කර්මාන්ත ණයහිමි ශේෂය නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

**1.3.4 විගණනය සඳහා සාක්ෂි නොවීම**

-----------------------------------

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන එකතුව රු.109,358,052 ක් වූ ස්ථාවර වත්කම් අයිතම 05 ක් සම්බන්ධයෙන් විධිමත්ව හා යාවත්කාලීනව සකස් කළ ස්ථාවර වත්කම් ලේඛනය ඉදිරිපත් නොකිරීම නිසා විගණනයේදී ඒවා සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය.

**1.3.5 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

-----------------------------------------------------------------------

පහත දැක්වෙන නීති, රීති සහ රෙගුලාසි විධිවිධානවලට අනුකූල නොවීමේ අවස්ථා විගණනයේ දී නිරීක්ෂණය විය.

| නීති, රීති රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම් |
|---|---|
| **ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | |
| (i) මුදල් රෙගුලාසි 396(ඈ) | ජංගම ගිණුම් දෙකකට අදාළව 2016 දෙසැම්බර් 31 දිනට ගෙවීම සඳහා ඉදිරිපත් නොකළ මාස 06 ක කාලය ඉක්මවා තිබුණු එකතුව රු.58,650 ක් වූ චෙක්පත් 28 ක් සම්බන්ධයෙන් යොමුගත රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. 2016 දෙසැම්බර් 31 දිනට වර්ෂ 02 ක |

| | |
|---|---|
| (ii) මුදල් රෙගුලාසි 570 හා 571(1)(2) | කාලයක් ඉක්ම වූ එකතුව රු.346,306 ක තැන්පතු වර්ග 04 ක ශේෂ නිවැරදිව හඳුනාගෙන නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. |
| (iii) මුදල් රෙගුලාසි 1645 හා 1646 | සභාවට අයත් වාහන 18 ක් වෙනුවෙන් දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

විගණනයට ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදමට වඩා වැඩි වූ ආදායම රු.2,546,679 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදමට වඩා වැඩි වූ ආදායම රු.2,773,831 ක් විය. ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේ දී සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු.227,152 ක පසුබෑමක් පෙන්නුම් කෙරුණි.

**2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය**

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) විධිමත් අනුමැතියකින් තොරව සභාව විසින් බඳවාගෙන තිබුණු සේවකයින්ගේ වැටුප් හා දීමනා ගෙවීම සඳහා සභාවේ ආදායමින් රු.5,141,923 ක් සමාලෝචිත වර්ෂයේදී ද වැයකර තිබුණු බව නිරීක්ෂණය විය.

(ආ) ඉකුත් වර්ෂයේ රු.6,318,252 ක් වූ සමුච්චිත අරමුදල් ගිණුමේ හර ශේෂය සමාලෝචිත වර්ෂයේ දී රු.2,558,054 ක් වූ නමුත්, සමුච්චිත අරමුදල් ගිණුමේ හර ශේෂයන් පැවතීම දුර්වල මූල්‍ය කළමනාකරණ තත්ත්වයක් බව ද විගණනයේ දී නිරීක්ෂණය විය.

**2.3 කාරක ප්‍රාග්ධන කළමනාකරණය**

ඉකුත් වර්ෂ සමඟ සැසඳීමේ දී සමාලෝචිත වර්ෂයේ ජංගම අනුපාතයේ සහ ක්ෂණික අනුපාතයේ අවම වර්ධනයක් පෙන්නුම් කෙරුණි.

**2.4 ආදායම් පරිපාලනය**

**2.4.1 වරිපනම් බදු**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134(1) හා (2) වගන්ති ප්‍රකාරව දියුණු කල ප්‍රදේශ හඳුනාගෙන වරිපනම් බදු අයකර ගැනීම කෙරෙහි සභාවේ අවධානය යොමු වී නොතිබුණි.

**2.4.2 අක්කර බදු**

------------

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂවලට අදාළව අයකරගත යුතුව තිබුණු රු.257,426 ක් වූ අක්කර බදු මුදලින් සමාලෝචිත වර්ෂය තුළ අය කරගෙන තිබුණේ සියයට 28 ක් තරම් අවම අගයක් වූ අතර, හිඟ අක්කර බදු අයකර ගැනීම සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 158(1)(අ) වගන්තිය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

**2.4.3 ව්‍යාපාර බදු**

------------

සමාලෝචිත වර්ෂ අවසානය වනවිටත් අය නොවී පැවතුන රු.80,450 ක ව්‍යාපාර බදු හා රු.30,200 ක් වූ කර්මාන්ත බදු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**2.4.4 උසාවි දඩ හා මුද්දර ගාස්තු**

-----------------------------

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2016 දෙසැම්බර් 31 දිනට මුද්දර ගාස්තු හා උසාවි දඩ වෙනුවෙන් රු.10,659,951 ක් ලැබිය යුතුව තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

---------------------------

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

---------------------------------

(අ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට නිලධාරීන් 17 දෙනෙකුගෙන් අයවිය යුතු ණය ශේෂ රු.80,878 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) (i) සේවක සංඛ්‍යා සැලැස්මේ පුරප්පාඩු 04 ක් හා අනුමත සංඛ්‍යාවන් ඉක්ම වූ අතිරික්ත සේවක සංඛ්‍යාව 11 ක් සිටි අතර, අතිරික්ත තනතුරු විධිමත් කර ගැනීමට හා පුරප්පාඩු පුරවා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ii) කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් සභාව සඳහා විදුලි ශිල්ප සේවකයකු අනුමත කර තිබුණු නමුත්, ඊට අදාළ බඳවා ගැනීම් සිදු නොකර, එකී කාර්යයන් සෞඛ්‍ය කම්කරුවකු ලවා ඉටු කරගෙන තිබූ අතර, 2016 සැප්තැම්බර් මස රාජකාරි කටයුතු කිරීමේ දී විදුලිසැර වැදීමෙන් එම සේවකයා මියගොස් තිබුණි.

(ඇ) සභාවේ බැංකු ගිණුම් 02 ක පැවැති මාසික සාමාන්‍ය ශේෂය රු.2,597,240 ක් වූ අතර, අතිරික්ත මුදල් ආයෝජනය නොකිරීම නිසා සභාවට උපයා ගත හැකිව තිබුණු ආදායම් අහිමි වී තිබුණි.

(ඈ) සභාව විසින් පරිහරණය කරන වාහන 06 ක අයිතිය සභාව වෙත පවරා ගැනීමට සමාලෝචිත වර්ෂය අවසන් වනවිටත් කටයුතු කර නොතිබුණි.

(ඉ) 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති 214 ප්‍රකාර වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පවත්වා නොතිබුණි.

**3.2 ව්‍යාපෘති ප්‍රමාද කිරීම**

----------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) 2016 වර්ෂය තුළ ප්‍රාදේශීය සභා ශක්තිමත් කිරීමේ ජාතික වැඩසටහන යටතේ හිරියමල්කුඹුර වැලිහේන මාර්ගය සංවර්ධනය කිරීම සඳහා ලබා දී තිබුණු රු.1,000,000 ක මුදල අදාළ කර්මාන්තය ඉටු කිරීමෙන් තොරව ආපසු යවා තිබුණි.

(ආ) පළාත් සභා මන්ත්‍රී ප්‍රතිපාදන යටතේ තෙල්ලඹුර සඳගිරිතැන්න පොදු ළිඳ ඉදිකිරීම, වල්පල පිංගොඩවත්ත පොදු ළිඳ ප්‍රතිසංස්කරණය හා වීථි පහන් නඩත්තුව යන කර්මාන්ත 03 ක් සඳහා රු.160,000 ක් සභාවට ලැබී තිබුණු නමුත්, එම කර්මාන්ත වර්ෂය තුළ ඉටුකර නොතිබුණි.

**3.3 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

-----------------------------------------

රෝද හතරේ කුබෝටා මිනි ට්‍රැක්ටරය සහ ටේලරය මෙන්ම මිට්ෂුබිෂි ඩබල් කැබ් රථයක් අලුත්වැඩියා කර, නැවත ප්‍රයෝජනයට ගැනීමට හෝ අපහරණය කිරීමට හෝ සමාලෝචිත වර්ෂය අවසාන වන විටද කටයුතු කර නොතිබුණි. මෙය 2015 ජූලි 10 දිනැති අංක 2/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ දැක්වෙන විධිවිධාන වලට අනුකූල නොවන තත්ත්වයක් විය.

**3.4 ඝන අපද්‍රව්‍ය කළමනාකරණය**

--------------------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය කිරීම සඳහා සභාව විසින් වල්පල වෙළෙන්දාව වත්තේ කොම්පෝස්ට් අංගනයක් ඉදිකර තිබුණු අතර, එහි දිරාපත් වන කාබනික අපද්‍රව්‍ය වලින් අඩු වියදමකින් කාබනික පොහොර නිෂ්පාදනය කර, අලෙවි කිරීමෙන් සමාලෝචිත වර්ෂයේ දී රු.133,337 ක් උපයාගෙන තිබූ නමුත්, සභාව එකතු කරනු ලබන නොදිරන අපද්‍රව්‍ය ගබඩා කාමරය තුළ සහ කොම්පෝස්ට් අංගනයේ පසෙක පවතින ගොඩනැගිල්ල තුළ ගබඩා කර තිබුණු අතර, එය අලෙවි කිරීමට හෝ ප්‍රතිචක්‍රීකරණය කිරීම සඳහා සභාව සතුව ඉදිරි වැඩපිළිවෙලක් නොතිබුණි.

(ආ) වෙළෙන්දාව වත්ත කොම්පෝස්ට් අංගනය සඳහා වහලක් ඉදිකර නොතිබුණු බැවින් වැසි දිනවල අධික දුගඳක් හමන බව ප්‍රකාශ කරමින් ප්‍රදේශවාසීන් විසින් ගාල්ල අතිරේක මහේස්ත්‍රාත් අධිකරණයේ නඩුවක් ගොනුකර තිබුණි.

(ඇ) මෙම කොම්පෝස්ට් අංගනයට වහලක් ඉදිකිරීම සඳහා සමාලෝචිත වර්ෂයට රු.1,000,000 ක ප්‍රතිපාදන අනුමත කර තිබුණු නමුත්, එම කර්මාන්තය ආරම්භ කර නොතිබුණි.

## 4. යහපාලනය හා ගිණුම් කටයුතුභාවය

---

### 4.1 අයවැය පාලනය

---

සමාලෝචිත වර්ෂය සඳහා වූ අයවැය ලේඛනයේ ඇතුළත් වියදම් විෂයයන් 09 ක එකතුව රු.17,946,412 ක් වූ ඉතිරිවීම් ද, ආදායම් විෂයයන් 05 ක ළඟාකර නොගත් ඉලක්කගත ආදායම් රු.12,008,512 ක් පැවතීම නිසා අයවැය ලේඛනය ඵලදායී මූල්‍ය කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

### 4.2 අභ්‍යන්තර විගණනය

---

ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 133 හා 134 හි විධිවිධාන හා පළාත් පාලන කොමසාරිස් (දකුණු පළාත) ගේ 2014 පෙබරවාරි 24 දිනැති අංක : දපපා/යහ/01/ නා.ච.ලේ දරන චක්‍රලේඛය ප්‍රකාරව අභ්‍යන්තර විගණන නිලධාරියෙක් පත්කර තිබුණ ද, ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.

### 4.3 විගණන හා කළමනාකරණ කමිටු ක්‍රියාත්මක කිරීම

---

2009 ජුනි 09 දිනැති අංක DMA/2009(i) දරන කළමනාකරණ විගණන චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව විගණන හා කළමනාකරණ කමිටු පිහිටුවීමට සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් කටයුතු කර නොතිබුණි.

## 5. පද්ධති හා පාලනය

---

විගණනයේ දී නිරීක්ෂණය වූ අඩුපාඩු වරින් වර විගණන විමසුම් මඟින් සභාවේ අවධානයට යොමු කරන ලදී.  පහත විස්තර දැක්වෙන පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමුවිය යුතුය.

| | පද්ධතිය | | පද්ධතියේ ප්‍රධාන අඩුපාඩු |
|---|---|---|---|
| (අ) | ගිණුම්කරණය | (i) | නොවෙනස්ව ඉදිරියට එන ගිණුම් ශේෂ නිරවුල් කර නොතිබුණි. |
| | | (ii) | මූල්‍ය ප්‍රකාශන සහ ඊට අදාළ උපලේඛනවල දැක්වෙන ශේෂ අතර වෙනස්කම් පැවැතුණි. |
| | | (iii) | නිකුත් කළ නමුත් ගෙවීම සඳහා ඉදිරිපත් නොකළ චෙක්පත් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. |
| | | (iv) | වසර දෙකක කාලයක් ඉක්මවා තිබුණු තැන්පතු ශේෂ නිරවුල් කර නොතිබුණි. |
| (ආ) | වාහන පාලනය | (i) | සභාව සතු වාහනවල ඉන්ධන දහනය පරීක්ෂා කිරීමට කටයුතු කර නොතිබුණි. |

| | | | |
|---|---|---|---|
| | | (ii) | නිෂ්ක්‍රීය වාහන අළුත්වැඩියා කිරීමට හෝ අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි. |
| | | (iii) | වාහනවල අයිතිය පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| | | (iv) | දෛනික ධාවන සටහන් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. |
| (ඇ) | අයවැය පාලනය | (i) | වියදම් විෂයයන් 09 ක ඉතිරිවීම් දක්නට ලැබුණි. |
| | | (ii) | ආදායම් විෂයයන් 07 ක අහිතකර විචලනයන් පැවැතුණි. |
| (ඇ) | ලේඛන නඩත්තු කිරීම | (i) | සභාව විසින් වාහන ලේඛනයක් පවත්වා නොතිබුණි. |
| | | (ii) | හානි පාඩු ලේඛනයක් නඩත්තු කර නොතිබුණි. |
| | | (iii) | ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර, පවත්වා නොතිබුණි. |
| | | (iv) | පරිගණක සම්බන්ධ ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා නොතිබුණි. |
| (ඉ) | සේවක මණ්ඩල කළමනාකරණය | (i) | කාර්ය මණ්ඩල පුරප්පාඩු පුරවා ගැනීමට මෙන්ම අතිරික්ත කාර්ය මණ්ඩලය විධිමත් කර ගැනීමටත් කටයුතු කර නොතිබුණි. |
| | | (ii) | සභාවේ සේවය කළ නිලධාරීන්ගේ ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| (ඊ) | ආදායම් රැස්කිරීම | (i) | හිඟ ආදායම් අයකර ගැනීම සඳහා විධිමත් වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කර නොතිබුණි. |
| | | (ii) | මුද්දර ගාස්තු ආදායම යාවත්කාලීනව අය කරගෙන නොතිබුණි. |
| | | (iii) | වරිපනම් කළාප ප්‍රකාශ කර, බදු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. |